
Page 6 October 2011.qxd 18/10/2011 17:08 Page 1



# නිර්මාණ Nirmana



අභාවප්‍රාප්ත කේ. ජයතිලක මහතා

## ළදරුවා

ඔබ සිටි තැන හුන්
ඒ අහිංසක
ළදරුවා කෝ ?
බියවන්න එපා
මා මහලු වන විට
ඔහු ඒවි !

(අත්පසුරු 41 වන කවිය)

## මතක නිවස

මතක නිවසෙහි
මුලින් තැන්පත් කළ
බඩුමුට්ටු
තවමත් එහි ඇත.
ඒවායින් බොහෝ
වැඩ ගතිමි.
තවමත් ගනිමි.
එයට ඊයේ පෙරෙයිදා
ගෙන ආ අලුත් බඩු
අව්වට වේලෙයි,
වැස්සට තෙමෙයි,
සුළඟට පෙරළෙයි,
කැඩී බිඳී යයි.

(අත්පසුරු 49 කවිය)

♦ කේ. ජයතිලක

## නොමිනිසුන් මැද එකම මිනිසා

දෙපා රිදවන බොරළු පිරි මග
ඇවිද ආ ඔබෙ රුව දුටිමි මම
එවිලස ම මම දිටිමි යළි ඔබ
තරුවක්ව බැබලෙනා ගුවනත

අතුපතර විහිදා සෙවණ දුන්
වනස්පතියක් ලෙසින් සිටි ඔබ
සෙවන ලද සැම අතරමං කොට
සැඟව ගියෙ කිම මෙලෙස පෙරදින?

හඬා නොගොසින් පුදපඬුරු වෙත
අදීනව දිවි ගෙවූ ඔබ හට
දිවි මගෙහි බෝකල් සරන්නට
එරෙහි වූයේ කිම් ද දෛවය ?

ඔබේ පන්හිඳ කගපතක් විය
නොනැමෙනා රජ මැතින් අබියස
එවන් කගපත් දුලබ මේ රට
විකුම් පෑ ඔබ වටී අපහට

තරු වැලක අවසන් තරුව ඔබ
මල් වැලක සුවඳැති කුසුම ඔබ
පරපුරක අවසන් පුරුක ඔබ
නොමිනිසුන් මැද මිනිසාය ඔබ

♦ බුද්ධදාස ගලප්පත්ති
Sri Lanka




## නිව්ගිය නැණ පහන් සිල!

සිහළ සාහිත අඹරෙ පැයූ සුපුන් සඳසේ දිලුණු මැති දුණි
හිරුට හිනැහෙන පියුම විලසින් බසට පෙම් කළ විද්වතා ණෙනි
ලියා පතපොත මහා හරබර දිවිය විවරණ කළේ වෙසෙ සිණි
දශක පහකට වැඩි කලක් ගිය මහඟු සාහිත ගමන නිම වුණි

ඇත පාසැල් කාලයේ සිට ඔබේ නිමැවුම් රසවිඳින් නෙමි
අදත් ඔබෙ නිර්මාණ සමගින් ජීවිතයෙ හැඩ රුව දකින් නෙමි
මෑත යුගයේ ඇසූ ඔවදන් ගුරු බැතින් නිති පිළිපදින් නෙමි
හෙළයෙ මහ ගත්කරු පියාණෙනි! ඔබේ දැනුමට හිස නමන් නෙමි

අලුත් කඩයේ කන්ද නගිමින් පැමිණිලා පොඩි ලියන ගෙය වෙත
හිස නමාගෙන අකුරු අමුණයි විමසමින් සාහිත කතා වත
සරල බසකින් නිවුණු හඬකින් බිණූ වදන් දෙසවන රැඳී ඇත
මහා ගත්කරු වුවත් මුව රැඳි සිනහවෙන් පෙන්නුවේ ගැමි සිත

මගේ සාහිත සළකුණක් එළි දකින විටකදි මහත් වෙහෙසින්
ගරු සරුව ඔබතුමා කැඳවා පිරිනමා මුල් පුටුව බැතියෙන්
දැත් එක්කර පිදුවෙ ඔබ වෙත ගුරු සෙනේහෙන් බරවූ සිතකින්
ඔබේ නැණ ගුණ සිහිකරමි නිති නිවන් මග මොක් සුවය පතමින්

♦ පද්මා කුරුප්පු Paris France

## කෝකිලානේ ඉසිවරයා

මේ පත විපත වලකනු බැරි කිසි කලක
සේසත සුවඳ පමණය පැහැසර මලක
සාහිත ගවර පිරි ගෝදෙහි ඉඳු නිලක
පෑ පත ඔහුය මහ කතුවර ජය තිලක

වීර ගහක් යට හෙවණේ නිදන විට
සාර සියක් මල් පිපුණේ නැත අවට
කෝකිලානෙ ඉසිවරයාණෙනි ඔබට
පාර මතක තිබුණා නැගි ගිරි හිසට

සඳළුතලා වල නොව වළගොඩැලි වල
දුදුලු මැදින් ආ ගමනකි නතර කළ
පබළු එකින් එක ගිලිහී වැටෙන කල
කඳුළු වැලක් පමණක් වෙයි කිරිඳි වැල

♦ රත්න ශ්‍රී විජේසිංහ
Sri Lanka

## එන්නම් පැන හොරෙන් අම්මා බලන්නට !

ස ත් කුලු මතින් පෑ සඳ මෙන් තරු සහසේ
නෙත් නුඹ දිලුනි මතකයි සිප් ලද දවසේ
ර ත් පැහැ අහස හිරු හැංගී ගිය රහසේ
නෙත් යුග නුඹේ සිහිවෙයි වෙන්වූ දවසේ

මි න් ද ද නුදුටු හදකට පෙම නොහැගේ දෝ
රොන්මඳ මලින් පිදු සඳ පින් නොලැබේ දෝ
ප න් හි ඳ කැඩී බොඳවූ කවි නොගැයේ දෝ
පි න් ම ඳ පුතුන්ටත් මව්ගුණ නොදැනේ දෝ

යන්නම් කියා ආවත් ලොව දිනන් නට
කවිකම් නොලද්දෙමි නුඹ ගුණ ගයන් නට
වන්නම් තාල නැටුවත් පිටරටුන් හට
එන්නම් පැන හොරෙන් අම්මා බලන් නට

♦ වෛද්‍ය උදාර කුලරත්න
Nottinghamshire UK



## දැක්ම !

තරු එළියක් නැති - සඳ එළියක් නැති
අඳුරු තලාවක දිවිය නැගේ
හිරු වැටුණත් මිදි - සඳ වැටුණත් මිදි
කඳුරු කරුවලයි දිවිය මගේ !

හිමිසඳ දිලුණා - සෙනෙහස වැඩුණා
පෙම්රස නැගුණා - යුගදිවි බැඳුණා
කල්යල් ගෙවුණා - දරු මල් පිපුණා
ඒ මල් සුවඳට බමරුන් ඇදුණා !
රිවිකල් තිර අභිමන් සිත් පාලා
සවිගල් මල්සේ දිවිය හදාලා
දිවි දැල් වැට අතරින් රිංගාලා
පිපිමල් ඇත තැන තැන විසිරීලා

කොතැනක වුව යම් යම් දේසෙක දුර
කෙනෙක් ඇතේ දුක් ගිනි නිවනා
සිත සුව දෙන තැන පියවර මැන ගම්
බුදුහාමුදුරුවො වැඩ සිටිනා

♦ මාලපල්ලේ
කුමුදු රොහාන් අමරසිංහ
Edmonton London UK

## පාඨක ඔබට වචනයක්

මෙම නිර්මාණ පිටුවට ඔබ ලියා එවන කවි පද සියල්ල අපි අගේ කරන් නෙමු. එහෙත් ඇතැම් අය ලියා එවන දෑ කවි හැටියට ගත නොහැකිය. බොහෝ විට ඒවා දිග වාක්‍ය රචනා වැනිය. කවිය කිසියම් තාලයක් සිතේ දරා ලිවිය යුත්තකි. තාලයක් නැති නිසඳැස් කවේ වුවද පද පෙළගස් වන රටාවක් ඇත. හැකි තරම් පැරණි කවි හා නූතන කවිද සොයා ගෙන කියවා කවි යනු මොනවාදැයි තේරුම් ගන්නට මහන්සි ගන්න. එසේම ඔබ ලියන කවි කෙටියෙක් ලියන්නේ නම් මැනවි. මක්නිසාද, මෙහි ඉඩකඩද සීමිත නිසාය. මෙසේ ලියන්නේ ඔබ අධෛර්‍යය කිරීමට නොවේ. ඔබ ලවා තවත් හොඳ කවි ලියවා ගැනීමටය.

ඔබට ජයවේවා!

- කර්තෘ

## ස්කොට්ලන්තයේ වසන්තය

පරිසරයම හරි සිරියා වයි
කඳුරැළි දිය ඇලි රමණී යයි
සිසිලස ගත සිත සනසා ලයි
මගෙ හද සතුටින් ඉපිලී යයි

නිල්වන් පාටින් කඳු පේලී
හරිතින් දිස්වන තණ පියලී
අවටින් දිස්වෙයි වන පේලී
සෙලවෙයි සුළඟට අතු රිකිලී

හිරු රැස් තැන තැන පැතිරී යයි
අඳුරු වළාකුළු නොපෙනී යයි
කුරුළු ගීතයෙන් මන පින වයි
වසන්ත සිරියෙන් ඉතිරී යයි

ගවයන් අසුවන් බැටළු ඇබිත් තන්
වන තීරුව මල් ගොමුයෙන් පිරි පුන්
තණපිටි පාළුව මකන කුරුල් ලන්
සිත පිනවන පරිසරයකි නිල් වන්

කඳු මුදුනින් හිම දියර ගලා යයි
දියකඩ දිය ඇලි අවටින් දිස් වෙයි
හිරිපොද වැස්සෙන් ගත නැවී යයි
සීතල සුළඟට හිරිගඩු පෑ දෙයි

සිසිල් දියෙන් දිය පොකුණු පිරී යයි
මලින් පිරුණු දිය රැළි විහිදා ලයි
සුදු හසහන සුදු සේලේ දිලි සෙයි
කුරුළු කොබෙයියන් තුටින් පිනා යයි

මල් වදුලේ ගුමු ගුමු නද පැති රෙයි
ගව රැළි තණපිටියේ විසිරී යයි
නෙක මල් පිපිලා වාගේ දිස් වෙයි
පුළුන් වළාකුළු අහසේ විසි රෙයි

තෙරක් නොදුටු පොඩි කඳුවැටි යායේ
ළා කොළ පැහැගත් සරු තණ පිටියේ
සුදුවන් බැටළුවො දස අත සිටියේ
සුදු මල් ඇතිරූ වැනි තණ පිටියේ

♦ සුබසිංහ එදිරිසූරිය
නුගේගොඩ Sri Lanka



## මිලින වූ කුසුම

ඉඳුසැව් ලියනේ සළුවෙන්
නේක වර්ණ ගෙන
තෙලිතුඩින් සිත්තම් කළ
සිතුවමෙහි තවරා
මනෝහර සිතුවමක් විලසින්
දනන් නෙත් අභිමුවට විත්
නහවා මකරන්දයෙන්
ඉනික්බිති
සිපගනියි වතකමල
වසුන්දරාවගේ
මිලින වූ කුසුම

♦ දුලිනි මදාරා
වෙඩික්කාර
පානදුර Sri Lanka

## සෙනරත් පරණවිතාන මහතා

සීගිරියේ මහ නටබුන් අතරේ
තවම ඔබේ හඬ සවන් පිනේ
ගල් මතුපිට ඇති අක්ෂර අතරේ
පහන අතින්ගත් ඔබව පෙනේ

ඇකී මැකී ගිය නටබුන් සොයමින්
කටුක පොළව මත පා තබමින්
වෙහෙස වෙලා රෑ නිදි වරමින්
සොයයි සොයයි ඔබ පැරණි වදන්

♦ මදාරා සමාධි පෙරේරා
ජාඇල - Sri Lanka

## විශ්වය ඔබය පියතුමනි !

කිරණ විහිදුවා තද - බිඳහෙළා ගන අඳුර
ගම්භීර බව මුසුව - මහා තෙද ඇත පැතිර
වන අරණ වැනි දරුට - හරිත දී විඳ මිහිර
**දිනපතිඳු** නුඹ නොවෙද - ලෝ දහම ලෙස පවර

දූ පුතුන් සරිකරන් - ඔබ හදේ ගැඹුරු තැන
ආදරේ සඳ කැනින් - නහවලා උන් සොඳින
තම එළිය විහිදුවා - සැමට එක ලෙස බෙදන
**තරුපතිඳු** නුඹ නොවෙද - තරු රැණ මැද දිලෙන

හැඩ රුවැති දූ පුතුන් - උපදලා හදාලූ
කලාවෙන් ඔප දමා - ගුණ නුවණ වඩාලූ
විදු රසය උර ගගා - බිඳෙන් බිඳ පොවාලූ
**බ්‍රහස්පති** නුඹ නොවෙද - සොඳුරුගුණ බෙදාලූ

මලින් සරු පලින් බර - අතුපතර විහිද වන
ජීව රස මිරිකලා - දරුවන්ට දී සොඳින
නොසලකා නෙක බේද - සමව දී තම සෙවන
**වනස්පති** නුඹ නොවෙද- හදවතින් සිනාසෙන

♦ ප්‍රදීපා වික්‍රමසිංහ
Wimbledon - London SW19

## පොල්ගස

ඇ ල් පැන් බොමින් ලොඳ කා
බඩගිනි නිවතී
මු ල් පැල අතු සුඹුළු
දඬු මිළට විකුණතී
මු ල් පිති කොළපු ලිප
ගිනි ලැමට ගනිතී
පොල් ගස වැනි ගසක් මේ
මුළු ලොවේ නැතී

## හිරු බැස යනවිට.....

කලක් පැතු දේ සැණින් අහිමිව
විඳින දුක මම ඔබත් දන්නෙද?
ඉතින් කෙලෙසද ඉවසන්නෙ මම
ආදරය මා හැඩවුවා නම්

හිරු බැස යනවිට සඳු නැඟුණා
සඳු බැස යනවිට හිරු නැඟුණා
ඔබ වෙන්වන විට දුක දැනුණා
කඳුළැලි නෙතු දෙදරා ගැලුවා

එදා කඳුළැලි තවත් දෙනෙතේ
නමුදු ඔබ නැත පෙනෙනමානේ
හඬන සිත මා තව රඟන්නේ
ජීවිතේ ඔබ නිසා තැවුණේ

තුෂාන් විදුරංග Sri Lanka

## ඉස්කෝලේ .......
## යන කාලේ .......

ඇරෙන වෙලාවට ඉස්කෝලේ
වැහි පිට මහ වැහි වැහැ පං
තෙමි තෙමි වැස්සේ තෙත බරිවී
නුඩුව ගෙදර යන කලටා
පාර කොටවෙලා ඇත එවිටා

Y M B A එක ළඟ ඉඳලම
තෙමි තෙමී ද උඹ ආවේ ?
නැද්ද තැනක් හෙවනට තිබුණේ ?
බොරැල්ල පාරෙන් ඇයි ආවේ ?

නෑ නෑ කාසල් වීදිය දිගේම
දුවගෙන මයි මං ආවෙ
කියන්නෙපා බොරු කට වහපං
පිහිද ගනින් ඔය තෙතබරි කොණ්ඩේ
වටස් පටස් ගා වැදේ ගුටී



ගුටියක් කෑවට මොකද ඉතින්
වැස්සට තෙමන්න ලැබෙනව නම්!
හෙටත් අනේ හොඳටම වැහැපන් !

♦ ලිලානි පෙරේරා
Essex UK